***2017 ජූලි මස 18 අඟහරුවාදා දින***
***2017ஜுலை மாதம்18 ஆம் திகதி செவ்வாய்க்கிழமை***
***Tuesday 18 th July 2017***

ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමාගේ මූලාසනාරූඪත්වයෙන් පෙ.ව.10.00 ට සභාව රැස්විය.
கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன அவர்களின் தலைமை - 10 .ப.வகித்தார்கள் மு. 00மணிக்கு சபைக் கூடியது.
The Council met at 10.00 a.m Hon.Chairman Kanchana Jayarathna preside the Chair

***ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා.***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------

සියළුදෙනාටම සුභ උදෑසනක් වේවා ! ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, ගරු අමාත්‍යතුමන්ලා, ඒ වගේම විපක්ෂනායකතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියගෙන් අවසරයි. අද දිනට න්‍යායපත්‍රානුකූලව මෙම ගරු සභාවේ වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා පළමුවෙන්ම තිබෙන්නේ,

**අභිනව මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිඥා හෝ දිවුරුම් දීම් : නැත**

**ගරු ආණ්ඩුකාරතුමාගෙන් ලැබෙන සංදේශ :**

***ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා.***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------

ආණ්ඩුකාරවර පුරෝගාමී වැඩ සටහනක් ලෙස සංචාරක ආකර්ශණීය ස්ථානයක් ලෙස කුඩව වසම සංවර්ධනය කිරීමේ පළාත් සභා විශේෂ ව්‍යාපෘතිය, 2017. ඉහත ව්‍යාපෘතිය සඳහා කලවාන ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව 2017.06.30 දින දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ අනුමැතිය ද ලබාගන්නා ලදී. මෙම ව්‍යාපෘතිය පළාත් සභාවේ සියළුම අමාත්‍යාංශ ඒකාබද්ධ වී කරනු ලබන ව්‍යාපෘතියක් බැවින් කරුණාකර පළාත් සභාවේ අනුමැතිය ලබාදීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. මෙම ව්‍යාපෘතිය යටතේ ඒ ඒ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ඉටු කිරීමට බලාපොරොත්තු වෙන කටයුතු පිළිබඳ දළ විස්තරයක් ඔබතුමන්ගේ පහසුව සඳහා මේ සමඟ එවමි.

මාෂල් පෙරේරා,
ගරු ආණ්ඩුකාරවර,
සබරගමුව පළාත.

එතුමා විසින් එවන ලද ලිපිය ඔබතුමන්ලා සියළුදෙනාටම ලැබෙන්න සළස්වනවා. ඉදිරි දිනයක දී මේ පිළිබඳව සාකච්ඡාවට ගැනීමට කටයුතු කරනවා.

**ගරු සභාපතිතුමාගේ නිවේදන : නැත**

**නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා :**

ගරු අමාත්‍ය ශ්‍රීලාල් වික්‍රමසිංහ මැතිතුමා.

*ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා.*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-------------------------------------------------------

ස්තුතියි ! ගරු ශ්‍රීලාල් වික්‍රමසිංහ අමාත්‍යතුමා වෙනුවෙන් මෙම ගරු සභාවේ නිවාඩු අනුමත කිරීම ක්‍රියාත්මක කරනු ලබනවා.

**ලිපි ලේඛණ පිළිගැන්වීම : නැත**

**කාරක සභා වාර්තා පිළිගැන්වීම : නැත**

**පෙත්සම් : නැත**

**ප්‍රශ්න :**

*ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා.*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-------------------------------------------------------

අපේ ගරු විපක්ෂනායක ඩබ්ලිව්.සෝමදාස මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති 6/1/2017/07 දරණ ප්‍රශ්නය සඳහා ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් කල් ඉල්ලා තියෙනවා.

**අමාත්‍යාංශ නිවේදන හෝ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ : නැත**

**පෞද්ගලික ප්‍රකාශ කිරීම් : නැත**

**ශෝක ප්‍රකාශ යෝජනා : නැත**

**පොදු කටයුතු ආරම්භයේ දී දැනුම් දීමක් අවශ්‍ය නොවන යෝජනා : නැත**

**පොදු කටයුතු ආරම්භයේ දී දැනුම් දීමක් අවශ්‍ය යෝජනා :**

*ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා.*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-------------------------------------------------------

මේ යටතේ බලන්ගොඩ නගර සභා මහජන පුස්තකාලය සඳහා වූ අතුරු ව්‍යවස්ථාව සභාගත කිරීම.

*ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත් මැතිතුමා.*
*கௌரவ பிரதான அமைச்சர்*
*Hon.Chief Minister Mahipala Herath*
-------------------------------------------

ගරු සභාපතිතුමනි, බලන්ගොඩ නගර සභා මහජන පුස්තකාලය සඳහා වූ අතුරු ව්‍යවස්ථාව මම සභාගත කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා.*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-------------------------------------------------------

ස්තුතියි ! ගරු ප්‍රධාන අමාත්‍යතුමනි. අද දින සභාගත කරන ලද

අතුරු ව්‍යවස්ථාව තමුන්නාන්සේලා සියළුදෙනාටම ලැබෙන්න සළස්වා තිබෙනවා. එය ප්‍රඥප්ති කාරක සභාව වෙත යොමු කිරීම සඳහා කටයුතු කරනවා.

**පළාත් සභාවේ පොදු කටයුතු :**

***ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා.***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------

2017 දෙවන පරිපූරක මුදල් ප්‍රකාශය සහ ඊට අදාළ විසර්ජන ප්‍රඥප්තිය පිළිබඳ සාකච්ඡා කිරීම හා අනුමැතිය ලබා ගැනීමේ අවස්ථාව. මේ සඳහා ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ආරාධනා කරනවා.

***ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත් මැතිතුමා.***
***கௌரவ பிரதான அமைச்சர்***
*Hon.Chief Minister Mahipala Herath*
-------------------------------------------

ගරු සභාපතිතුමනි, සබරගමුව පළාත් සභාවේ 2017 දෙවන පරිපූරක මුදල් ප්‍රකාශය සහ ඊට අදාළ විසර්ජන ප්‍රඥප්තිය පිළිබඳ සාකච්ඡා කිරීම සහ අනුමැතිය ලබා ගැනීම සඳහා මම මේ අවස්ථාවේ දී ගරු සභාව වෙත ඉදිරිපත් කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා.***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------

ස්තුතියි ! ගරු ප්‍රධාන අමාත්‍යතුමනි. මේ වනවිට අපි තමුන්නාන්සේලා සියළුදෙනා වෙතම ඒ පරිපූරක ඇස්තමේන්තුවේ පිටපත් ලැබෙන්න සළස්වා තිබෙනවා. සභාගත කරන ලද පරිපූරක ඇස්තමේන්තුව පිළිබඳව ගරු විපක්ෂනායකතුමාට අවස්ථාව.

***ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස මැතිතුමා.***
***கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதச***
*Hon.Opposition Leader W.Somadasa*
------------------------------------------------------

ගරු සභාපතිතුමනි, මුදල් අමාත්‍යාංශයෙන් ඉදිරිපත් කරන පරිපූරක ඇස්තමේන්තුව මම හිතන්නේ ඊරිදා හැන්දෑ වෙනකොට තමයි අපට ලැබුනේ. ඊරිදා හැන්දෑවේ සිට දිනයක් තුළදී මේක අපට කියවලා කටයුතු කරන්න පුළුවන් කමක් නෑ. අපි ගිය පරිපූරක ඉදිරිපත් කරන වෙලාවෙත් මේ ගැන සිහිපත් කළා, අපිව දින 7 කටවත් කලින් දැනුවත් කරන්න කියලා. මේක පූර්වාදර්ශයට ගන්න එපා කියන ඉල්ලීම මම කරනවා. මේක අපි ගරු සභාපතිතුමනි, මේ හැම වෙලාවේම පරිපූරකයක් ඉදිරිපත් කරනකොට විපක්ෂයේ සහයෝගය අපි ලබාදීලා තියනවා. ඒ එක්කම අපි කියන්න ඕන ප්‍රධාන ඇමතිතුමා ඇරුනාම අනෙකුත් අමාත්‍යාංශවල ඇමතිවරු අපේ විපක්ෂයේ මන්ත්‍රීවරු ගැන මීට වඩා අවධියෙන් ඉදලා ඒ අයගේ ඉල්ලීම් ඉටු කරලා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා මේ සභාවේ.

ඒ එක්කම ගරු සභාපතිතුමනි, මම කියනවා අපි ඒ පරිපූරක ඇස්තමේන්තුවට අපේ අනුමැතිය ලබා දෙනවා කියලා.

***ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා.***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------

ස්තුතියි ! ගරු විපක්ෂනායකතුමනි.

***ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත් මැතිතුමා.***
***கௌரவ பிரதான அமைச்சர்***
*Hon.Chief Minister Mahipala Herath*
-------------------------------------------

ගරු සභාපතිතුමනි, මෙම 2017 පරිපූරක මුදල් ප්‍රකාශය හා විසර්ජන ප්‍රඥප්තිය අනුමත කිරීම සඳහා විපක්ෂයේ ගරු විපක්ෂනායකතුමා තම කණ්ඩායමේ නායකයා ලෙස මේ කටයුත්ත සඳහා අපට ලබාදෙන සහයෝගය ගැන පළාතේ ජනතාව වෙනුවෙන් ඇත්තෙන්ම අපේ ගෞරවය, ප්‍රණාමය අපි පුද කරනවා. විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි, මේ ප්‍රඥප්තිය ඉදිරිපත් කිරීම සඳහා මට මගේ ගරු ආණ්ඩු පක්ෂයේ රැස්වීමේ දී මෙම අපට, අපේ කාලය අවසන් වෙන අවස්ථාවේ ඉදිරි මැතිවරණයට මුහුණ දීම සඳහා විශේෂයෙන්ම මන්ත්‍රීවරුන්ගේ යෝජනා සහ අදහස්වලට ජනතාව වෙනුවෙන් කටයුතු කරන්නත් පුළුවන් වෙන ආකාරයට යම්කිසි මුදල් ප්‍රමාණයක් ඒ අය වෙත සංවර්ධන කටයුතු සඳහා ලබා දීමේ බලාපොරොත්තුවක් ඇතුවයි, අපේ ආණ්ඩු පක්ෂයෙන්මයි මේක ඉල්ලීමක් කළේ. ඒ වගේම විපක්ෂනායකතුමා වෙනමම විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා කැඳවලා එතුමන්ලාම ඉල්ලීමක් කළා ඉක්මණින් මේ පරිපූරකය දමන්න, අපිත් සහයෝගය දෙනවා කියලා. ඒ වගේම අද එතුමන්ලා ඒ කටයුත්ත කළා. ඒ නිසා අපි මෙතෙක් කිසිම අපේ මැති ඇමතිවරයෙක් අමාත්‍ය මණ්ඩලය හෝ එහෙමත් නැත්නම් අපේ ආණ්ඩු පක්ෂය හෝ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මෙහෙම සැළකුවා, අරහෙම සැළකුවා කියලා කොයි අවස්ථාවකවත් අපි වෙනස් කමක් දක්වලා නෑ. අපි අතර තියන ඒ මිත්‍රත්වය තුළින්ම අපට අපේ ජනතා සේවය, ජනතාව දුන්න කාලය අවසන් කරන්නට සතුටින් ලැබෙන අවස්ථාවක් හැටියට ගරු සභාපතිතුමනි, මම මේ කාර්යය දකිනවා. ඒ හින්දා මම විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා විපක්ෂයේ අපේ විපක්ෂනායකතුමාට තමන්ගේ කණ්ඩායමේ නායකයා ලෙස ඉතාම වගකීමකින් මේ කටයුත්ත සඳහා අපේ පරිපූරකය අනුමත කිරීම සඳහා සහයෝගය දීම ගැන.

ඒ වගේම මේ අවස්ථාවේ දී මම මගේ අමාත්‍ය මණ්ඩලයටත් ඒ වගේම මගේ ආණ්ඩු පක්ෂයේ සියළුම මන්ත්‍රීතුමන්ලාටත්, ඒ වගේම විපක්ෂයේ විපක්ෂනායකතුමා ඇතුළු සියළුම මන්ත්‍රීතුමන්ලාටත්, අපේ මන්ත්‍රීතුමිය ඇතුළු මම ස්තුතිවන්ත වෙනවා මේ කටයුත්තේ දී ඔබ ලබාදෙන සහයෝගය විශේෂයෙන් මෙය සකස් කරන්න ප්‍රධාන ලේකම්තුමා ඇතුළු අමාත්‍යාංශ ලේකම්වරු ඇතුළු ඒ සහභාගී වූ සෙසු නිළධාරීන්ටත් ස්තුතිවන්ත වෙමින් ගරු සභාපතිතුමනි, මෙම විසර්ජන ප්‍රඥප්තිය අනුමත කර දෙන ලෙස මම ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

***ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා.***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------

ස්තුතියි ! ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත් මැතිතුමනි. ඒ අනුව ගරු සභාවෙන් අහන්නේ මේ පිළිබඳව

බෙදීමකට යාමට අවශ්‍යයිද ? හොඳයි මේ අනුව 2017 වසරේ දෙවන පරිපූරක මුදල්

ප්‍රකාශය සහ ඊට අදාළ වන්නා වූ 2017 අංක 01 දරණ විසර්ජන ප්‍රඥප්තිය මඟින් සංශෝධනය වූ 2016 අංක 04 දරණ විසර්ජන ප්‍රඥප්තිය සහ සංශෝධනය සඳහා වූ විසර්ජන ප්‍රඥප්තිය 2016 අංක 02 හා 2016 අංක 05 දරණ විසර්ජන ප්‍රඥප්තිය මඟින් සංශෝධනය වූ 2015 අංක 04 දරණ විසර්ජන ප්‍රඥප්තිය සංශෝධනය සඳහා වූ විසර්ජන ප්‍රඥප්තිය යන විසර්ජන ප්‍රඥප්ති ඒක ඡන්දයෙන් සභා සම්මත වූ බව මේ ගරු සභාවට දැනුම් දෙනවා.

**පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු : නැත**

**සභාව කල් තැබීමේ යෝජනාව :**

***ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා.***
***கௌரவ அகட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன.***
*Hon.Gov.Whip Asoka Jayawardane*
--------------------------------------------------------

ගරු සභාපතිතුමනි, මෙම ගරු සභාව 2017 අගෝස්තු මස 15 වෙනි දින පෙරවරු 10.00 දක්වා කල් තබන ලෙස මා යෝජනා කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා.***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
--------------------------------------------------------

ස්තුතියි ! ගරු සභානායකතුමනි.

**සභාව කල් තබන අවස්ථාවේ යෝජනා :**

***ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා.***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
--------------------------------------------------------

සභාව කල් තබන අවස්ථාවේ යෝජනා ඉදිරිපත් කිරීම සඳහා සිරිපාල කිරිඇල්ල මැතිතුමාට අවස්ථාව.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමා.***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*
-----------------------------------------------------

ගරු සභාපතිතුමනි, මම හරි කණගාටුවට පත් වෙනවා මේ සම්බන්ධව. ගරු සභාපතිතුමනි, මේ සභාව දෙවනත් කරලා කම්කරු කොමසාරිස් හරහා මේ අසරණ ජනතාවගේ වැටුප වැඩි කරලා දෙන්න කියන එක කාලාන්තරයක් තිස්සේ කියනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමා මේ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරයි කියලා මම හිතනවා. මේක කාලාන්තරයක් තිස්සේ ගරු සභාපතිතුමනි, එන්නේ. මේ ආරක්ෂකයින්ගේ වැටුප දැන් එදා අපි හරි සතුටු වුනා රු.1000/- ක් කරලා දෙනවා කියලා. ඒක මාසයක් දීලා තියනවා. මේක හරි අශෝභන ක්‍රියාවක්. මේ පළාත් සභාවේ ගරු සභාපතිතුමා ඉදිරියේ දී මේ ආරක්ෂකයින්ට දෙන්නේ රු.650/- යි. ඒක වැඩි කරලා දෙන්න කියනකොට මාසයක් 1000/- ගානේ දීලා දැන් ආයේ රු.650/- යි. හරි අශෝභනයි. මේක මේ කොන්ත්‍රාත් ගන්න පුද්ගලයා ගැන විශේෂ අවධානය යොමු කරන්න. එහෙම නැත්නම් මට කියන්න සිද්ධ

වෙනවා මේ කොන්ත්‍රාත් ගන්න පුද්ගලයා අල්ලසක් දෙනවා ඇති මේ බලධාරීන්ට.

ඇයි මේ 650/- කරලා තියෙන්නේ ? හරි අශෝභනයි මේ ක්‍රියාව. මොකද අපිත් කන බොන මිනිස්සු. මේ මිනිස්සු චීස්, බටර්, හැම්, බේකන් කන්නේ නෑ. මේකෙන් බොහොම අමාරුවෙන් තුන්වේල බතක් උයාගෙන, පොල් සම්බෝලයක් එක්ක කන්නෙ. එහෙම නැත්නම් ළමයෙක්ට දෙනවා නම් කිරිපිටි පැකට් එකක්. මේ අසරණ මිනිස්සු. ඉතින් මේක ආයෙත් මෙතන කථා කරන්න තියන්න එපා. සමහරවිට තව මාස දෙකකින් මේ සභාව විසුරවනවා. මේ බලන්න කොච්චර වැරදිද කියලා රු.650/- ක් දෙනකොට. මේ කොන්ත්‍රාත්කරුවා තර කරනවා. ඔහු මේ කොන්ත්‍රාත් එක අරගෙන නිකම් ඉදලා ලක්ෂ ගණන් ගෙදරට වෙලා ගන්නවා. වැඩ කරන අසරණයාට රු.650/- යි. 1000/- එක මාසයයි දුන්නේ. දැන් අපි මේ සභාවේ මේක ගැන කථා කරලා එකොළොස්වතාවක්. මේක හරි අශෝභනයි. මේක හැල්ලු කරන්න එපා මේ සභාව.

ඒ වගේම ක්ලීනින් සර්විස් එකේ ඉන්න අර අහිංසක කම්කරුවෝ රු.500/- යි කියලා මේ සභාවේ කෑ ගැහුවා. මේ ලඟදී දැන් මාස දෙකක් තිස්සේ කිව්වා, තමුන්නාන්සේට ලිපියකින් ඉදිරිපත් කළා රු.500/- යි දෙන්නේ, මොකක්ද මේ අසාධාරණය කියලා. ඇති එකා තර කරන්න නෙමෙයි, නැති එකා තර කරන්න. අසරණ මිනිස්සු.

ඒ වගේමයි මේ ගරු සභාවේ දැන් බල්බ් 35 ක් පත්තු වෙන්නේ නෑ. මේ බලන්න. මේවා තවත් කාරණා තියනවා. මම එළි කරන්න බලාපොරොත්තු වෙන්නේ නෑ. මේ බල්බ් ටිකවත් අපට දාලා දෙන්න. බල්බ් 35 ක් වැඩ කරන්නේ නෑ දැන්. ඒ වගේම අනෙක් අයට කියන්න මේක අවම කරගන්න, නාස්තිය දූෂණය. හැම තැනම ගියාම වැසිකිලියට යනකොට වැසිකිලිය ඇතුලේ බල්බ් තුන හතරක් පත්තු වෙනවා. එළියේ බල්බ් 08 ක් පත්තු

වෙනවා. මගේ වැඩේ යන යන වෙලාවට ඒක නිවනවා. නමුත් මම බැලුවා මේ විපක්ෂයේ විතරයි නිවන්නේ. ආණ්ඩු පක්ෂයේ ඒවා නිවන්නේ නෑ. ඒවා එහෙමම තියනවා. නාස්තිය දූෂණය අවම කරන්න පුළුවන්. විදුලි බිල යනවා නම් ලක්ෂ 30 ක්, ලක්ෂ 07 ට බස්සන්න පුළුවන්. මේක මම, මම නෙමෙයි අපේ, අපේ කියන හැඟීම ඇති කරන්න ගරු සභාවේ සභාපතිතුමනි. මට ආයේ කථා කරන්න එපා සිකියුරිටි, ආරක්ෂක නිළධාරීන්ගේ 650/-......

*ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ මැතිතුමා.* *கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க* *Hon.Member Ramya Kumara Weerasinghe* ---------------------------------------------------------

කෝටි ගණන් ගහනවානේ.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමා.*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*
*Hon.Opposition Whip Siripala Kiriella*
----------------------------------------------------

කවුද කෝටි ගණන් ගහලා තියෙන්නේ ? ඕක අවුස්සා ගත්තොත් කියන්න සිද්ධ වෙනවා, තමුන්නාන්සේගේ ඇඳුම ගැලවෙන්න.

(සභාවෙන් ඝෝෂා)

*ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා.*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------

අවසන් කරන්න. සිරිපාල මන්ත්‍රීතුමා අවසන් කරන්න.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමා.*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*
*Hon.Opposition Whip Siripala Kiriella*
-----------------------------------------------------

ඔබතුමාගේ නිකම් නම සවුත්තු කරගන්න එපා. ගරු සභාපතිතුමනි, මේක මේ අසාධාරණයක්. ආරක්ෂකයින්ගේ 650/- අනිවාර්යයෙන්ම අනෙක් මිනිස්සුන්ටත් දෙන විදිහට කටයුතු කරන්න. එහෙම නැත්නම් සභාවේ මන්ත්‍රීවරයෙක් වශයෙන් මම කම්කරු කොමසාරිස් ජනරාල්ට මේක ලියන්න සිද්ධ වෙනවා. සභාවේ තමුන්නාන්සේට අවනම්බුවක් මේක. ඒ නිසා මේ අසරණයාගේ 500/- වැඩි කරලා දෙන්න. 650/- ආරක්ෂකයාගේ මුදල වැඩි කරලා දෙන්න. මෙන්න මේ බල්බ් ටික දාලා දෙන්න. බොහොම ස්තුතියි ! තමුන්නාන්සේ කාලය ලබාදීම සම්බන්ධයෙන්.

*ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා.*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------

සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමනි, ඔබතුමා විසින් සභාවේ මීට කලින් ඉදිරිපත් කරන ලද පෞද්ගලික සනීපාරක්ෂක සේවාවේ කම්කරුවන් සඳහා රජයේ අනුමත වැටුප් ලබා නොදීම පිළිබඳව

ඔබතුමා විසින් පසුගිය දිනක ඉදිරිපත් කරන ලද ලිපියට පිළිතුරු එවලා තියනවා ප්‍රධාන ලේකම්තුමා විසින්. ඒ ලිපිය ඔබතුමාට ලැබෙන්න සළස්වනවා. ඒ අනුව ඒ පිළිබඳව කටයුතු කරගෙන යන බව එතුමා දැනුම් දීලා තියනවා. සභා ලේකම් කාර්යාලය හරහා සනීපාරක්ෂක කටයුතුවත්, ආරක්ෂක කටයුතුවත් කාරණා සිද්ධ වෙන්නෙ නෑ. ඔබතුමා කියන කාරණාවට අපි එකඟයි. අපට තේරෙනවා බොහොම පැහැදිලිව ඒ කාරණාව සාධාරණයි. ඔබතුමා පැහැදිලිව සභා කටයුතු කාරක සභාවෙත් නිරන්තරයෙන් කථා කරන කාරණාවක්. ඉතින් ඒ නිසා ඒ පිළිබඳව යම් සාධාරණයක් කර දීමට මැදිහත් වෙනවා කියන එක ඔබතුමාව දැනුවත් කරනවා. මීළඟට ගරු කේ.එල්.රත්නායක මන්ත්‍රීතුමා. එතුමා සභාවේ නෑ.

දැන් වේලාව පෙරවරු 9.44 යි. අද දිනට මෙම ගරු සභාවේ වැඩ කටයුතු අවසන් වෙනවා. මෙම ගරු සභාව 2017 ක් වූ අගෝස්තු මස 15 වෙනි දින පෙරවරු 10.00 දක්වා කල් තබනවා.

අත්/කළේ:
කංචන ජයරත්න,
සභාපති,
සබරගමුව පළාත් සභාව.

පී.එස්.ආර්.එම්.විජයරාජ,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

2017.08.02 වෙනි දින,
සභා ලේකම් කාර්යාලයේ දීය.